2026 ජුලි මස 24 වන දින,

ප්‍රවෘත්ති කතෘ සහ සංස්කාරක

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වෙත කරණු ලබන ආරාධනයි

ප්‍රිය මහත්මයාණනි, ප්‍රිය මහත්මිය,

එක්සත් සමාජවාදි පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශය ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරය කර දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

මාධ්‍ය ප්‍රකාශය

**අධිකරණයේ ස්වාධීනත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමට පෙළ ගැසෙමු**

වර්තමාන ආණ්ඩුව උපරිමාධිකරණයේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම කාලය වසර දෙකකින් දීර්ඝ කිරිමට කටයුතු කරණ බවට තොරතුරු ලැබෙමින් පවතී. මෙය තවදුරටත් රහසක් නොවේ. මෙයට හේතු වශයෙන් ආණ්ඩුව පවසන්නේ අධිකරණය පද්ධතිය තුළ පවතින නඩු ගොඩගැසිමට පිළියමක් වශයෙන් මෙය සිදුකරණ බව ය. එය විහිලු කතාව කී. එසේ නම් පළමුව කළ යුතු තිබෙන්නේ මෙ වනවිට ශ්‍රෙෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පුරප්පාඩුවී තිබෙන විනිසුරුවරුන් අට දෙනා වහාම එම ධූරයන් සඳහා පත් කිරිමට පියවර ගැන්වීම ය. තව ද  නඩු ගොඩ ගැසිමට පිළියම් වශයෙන් කළයුතු ප්‍රතිසංස්කරණ බොහොමයක් ඇත. දැනට තිබෙන උසාවි ප්‍රමාණය වැඩි කරමින් ඊට සරිලන විනිශ්චයකාරවරුන් බඳවා ගත යුතු ය.කාර්ය මණ්ඩල සේවකයින් වැඩි කිරිමට පියවර ගනිමින් අනුසාංගික ආයතනවල මානව සම්පත් ප්‍රසාරණය කළ යුතු ය. එවැනි දීර්ඝ කාලීන පිවරයන් නොගෙන ඉහල අධිකරනවල විනිසුරුවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරිම පය බරවායට පිටකර බෙහෙත් බඳිනවා වැනි ය. මේවා අන්දරේගේ විහිලුවලටත් වඩා හාස්‍ය ජනකය.

අපට හැඟී යන්නේ මෙම ක්‍රියාව තුළින් බලාපොරොත්තුවන්නේ අණ්ඩුවට අවශ්‍ය ලෙස විනිසුරුවරයෙකුගේ  සේවා කාලය දීර්ඝ කිරිම සඳහා සිදුකරණ උප්පරවැට්ටියක් ලෙස ය. මෙය ප්‍රජාතන්ත්‍රවාදි සම්ප්‍රදායන්ට පටහැනි වන අතර අධිකරණයේ ස්වාධීන පැවත්මට බරපතල හානිදායක ක්‍රියාවකි. ආණ්ඩුවේ මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධි ක්‍රියාවට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු බලවේග පෙරට එන ලෙස අපි ආයාචනා කරන්නෙමු.

ස්තුතියි

මෙයට විශ්වාසී,

සිර්තුංග ජයසූරිය
ප්‍රධාන ලේකම්
එක්සත් සමාජවාදි පක්ෂය